# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2489/02 - 2026 මැයි මස 18 වැනි සඳුදා - 2026.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ඇ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

වයඹ පළාතේ, පළාත් පාලන කොමසාරිස් හේරත් මුදියන්සේලාගේ සංජීවනී හේරත් වන මම, අභියාචනාධිකරණ නඩු අංක. CA /WRT/0672/25 සඳහා ලබා දී ඇති නියෝගය පරිදි, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ සභාපති, උප සභාපති තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා වන පළමු රැස්වීම 2026 මැයි මස 27 වන දින පෙ.ව.10.30 ට ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාව, වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව, වනාතවිල්ලුවදී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**එච්. එම්. සංජීවනී හේරත්,**
පළාත් පාලන කොමසාරිස්,
වයඹ පළාත.

2026 මැයි මස 18 වැනි දින,
වයඹ පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව,
2 වන මහල, විදුසර,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

EOG 05 - 0198

1A - PG 7712 — 04 (2026/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*